# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2026.04.11 පැය 1130 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/ 592 /2026 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


<u>පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාර්තා වූ වැදගත් තොරතුරු.</u>

***பொலிஸ் ஊடகப் பிரிவுக்கு அறிவிக்கப்பட்ட முக்கிய தகவல்கள்***

**01. ලොරි රථයක් යතුරුපැදියක ගැටී පැදිකාරිය ජීවිතක්ෂයට - මිද්දෙණිය පොලිස් වසම.**

2026.04.10 දින උදෑසන මිද්දෙණිය පොලිස් වසමේ හුංගම මිද්දෙණිය මාර්ගයේ සූරියපොකුණ ප්‍රදේශයේදී මිද්දෙණිය දෙසට ධාවනය වූ යතුරුපැදියක් මාර්ගයේ වම්පස අයිනේ නවතා පිටුපස අසුනේ ගමන් ගත් පුද්ගලයෙකු හා දැරියක් යතුරුපැදියෙන් බසින අවස්ථාවේදී එම දිසාවටම පිටුපසින් පැමිණි ලොරි රථයක් රියැදුරුට රථය පාලනය කර ගැනීමට නොහැකිව යතුරුපැදියේ ගැටී අනතුරක් සිදුව ඇත.

අනතුරින් යතුරුපැදිය පැදවූ පැදිකාරිය, පුද්ගලයෙකු හා දැරියක් තුවාල ලබා තලාව රෝහලට ඇතුළත් කිරීමෙන් අනතුරුව පැදිකාරිය මියගොස් ඇත. මෙලෙස අනතුරට පත්ව ඇත්තේ එකම පවුලේ බිරිඳ, ස්වාමිපුරුෂයා හා ඔවුන්ගේ දියණිය බවට අනාවරණය වී ඇත.

**මරණකාරිය අවුරුදු 44 ක් වූ සූරියපොකුණ ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

අනතුරට සම්බන්ධ ලොරි රථයේ රියැදුරු අත්අඩංගුවට ගෙන ඇති අතර මිද්දෙණිය පොලිසිය විසින් වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

***லாரி மோதியதில் மோட்டார் சைக்கிள் ஓட்டுநர் பெண் உயிரிழப்பு – மித்தெனிய பொலிஸ் பிரிவு***

*2026.04.10 அன்று காலை மித்தெனிய பொலிஸ் பிரிவில் ஹுங்கம-மித்தெனிய சாலையில் சூரியபொகுண பகுதியில், மித்தெனிய நோக்கி சென்ற மோட்டார் சைக்கிள் சாலையின் இடப்புறத்தில் நிறுத்தப்பட்டிருந்தபோது பின்னிருக்கையில் இருந்த நபர் மற்றும் ஒரு சிறுமி இறங்கும் நேரத்தில், அதே திசையில் பின்னால் வந்த லாரி ஓட்டுநரால் வாகனத்தை கட்டுப்படுத்த முடியாமல் மோட்டார் சைக்கிளில் மோதியுள்ளது.*

*விபத்தில் மோட்டார் சைக்கிள் ஓட்டிய பெண், ஒரு நபர் மற்றும் ஒரு சிறுமி காயமடைந்து தலாவ மருத்துவமனையில் சேர்க்கப்பட்ட பின்னர், ஓட்டுநர் பெண்*

உயிரிழந்துள்ளார். உயிரிழந்தவர் 44 வயதுடைய சூரியபொகுண பகுதியைச் சேர்ந்தவர் ஆவார். சம்பவம் ஒரே குடும்பத்தைச் சேர்ந்த தம்பதி மற்றும் அவர்களின் மகள் தொடர்புடையது என தெரியவந்துள்ளது. லாரி ஓட்டுநர் கைது செய்யப்பட்டுள்ளார்.

**02. ලොරි රථයක ගැටී පදික කාන්තාවක් ජීවිතක්ෂයට - තෙල්දෙණිය පොලිස් වසම.**

2026.04.10 දින උදෑසන තෙල්දෙණිය පොලිස් වසමේ මහනුවර මහියංගණය මාර්ගයේ මළුවේගම ප්‍රදේශයේදී මහියංගණය දෙසට ධාවනය වූ ලොරි රථයක් මාර්ග හරහා ගමන් කල පදික කාන්තාවකගේ ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ කාන්තාව තෙල්දෙණිය රෝහලට ඇතුළත් කිරීමෙන් පසු මියගොස් ඇත.

**මරණකාරිය අවුරුදු 24 ක් වූ එනමල්පොත ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

ලොරි රථයේ රියැදුරු අත්අඩංගුවට ගෙන ඇති අතර තෙල්දෙණිය. පොලිසිය විසින් වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

***லாரி மோதியதில் பாதசாரி பெண் உயிரிழப்பு – தெல்தெனிய பொலிஸ் பிரிவு***

2026.04.10 அன்று காலை தெல்தெனிய பொலிஸ் பிரிவில் மகியங்கன–கண்டி சாலையில் மலுவேகம பகுதியில், மகியங்கன நோக்கி சென்ற லாரி ஒன்று சாலையை கடந்து சென்ற பாதசாரி பெண்ணுடன் மோதியுள்ளது.

காயமடைந்த பெண் தெல்தெனிய மருத்துவமனையில் சேர்க்கப்பட்ட பின்னர் உயிரிழந்துள்ளார். அவர் 24 வயதுடைய எனமல்பொத பகுதியைச் சேர்ந்தவர் ஆவார். லாரி ஓட்டுநர் கைது செய்யப்பட்டுள்ளார்.

**03. යතුරුපැදියක ගැටී පදික කාන්තාවක් ජීවිතක්ෂයට - කළුතර දකුණ පොලිස් වසම.**

2026.04.10 දින උදෑසන කළුතර දකුණ පොලිස් වසමේ කොළඹ ගාල්ල මාර්ගයේ කටුකරුන්ද ප්‍රදේශයේදී ගාල්ල දෙසට ධාවනය වූ යතුරුපැදියක් මාර්ගයේ ගමන් කල පදික කාන්තාවකගේ ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් කාන්තාව තුවාල ලබා කළුතර නාගොඩ රෝහලට ඇතුළත් කිරීමෙන් පසු මියගොස් ඇත.

**මරණකාරිය වයස අවුරුදු 80 ක් වූ පයාගල ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

අනතුරට සම්බන්ධ යතුරුපැදිකරු අත්අඩංගුවට ගෙන ඇති අතර කළුතර දකුණ පොලිසිය විසින් වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**

***மோட்டார் சைக்கிள் மோதியதில் பாதசாரி பெண் உயிரிழப்பு – களுத்துறை தெற்கு பொலிஸ் பிரிவு***

2026.04.10 அன்று காலை களுத்துறை தெற்கு பொலிஸ் பிரிவில் கொழும்பு-காலி சாலையில் கட்டுகருந்த பகுதியில், காலி நோக்கி சென்ற மோட்டார் சைக்கிள் ஒன்று பாதசாரி பெண்ணுடன் மோதியுள்ளது.

காயமடைந்த பெண் களுத்துறை நாகொட மருத்துவமனையில் சேர்க்கப்பட்ட பின்னர் உயிரிழந்துள்ளார். அவர் 80 வயதுடைய பயாகல பகுதியைச் சேர்ந்தவர் ஆவார். மோட்டார் சைக்கிள் ஓட்டுநர் கைது செய்யப்பட்டுள்ளார்.

**பொலிஸ் ஊடகப் பிரிவு**